**රණවිරු සේවා අධිකාරිය - 2020**

**------------------------------------**

**1.** **මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1** **තත්ත්වාගණනය කළ මතය**

**-------------------------------**

රණවිරු සේවා අධිකාරියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශන හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර රණවිරු සේවා අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**---------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී රණවිරු සේවා අධිකාරියේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය රණවිරු සේවා අධිකාරියේ ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මාණ්ඩලික විද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, රණවිරු සේවා අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් රණවිරු සේවා අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ රණවිරු සේවා අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, රණවිරු සේවා අධිකාරියේ ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2010 මාර්තු 22 වන දින අධිකාරිය වෙත පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණ පර්චස් 20.40 ඉඩම් කොටසේ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට පියවරගෙන නොතිබුණ අතර පරිත්‍යාග ලෙස ලැබී තිබුණු රු.50,000 ක මුදලක්ද ගිණුම් ගතකර නොතිබුණි. | ඉඩමේ නම සඳහන් කිරීමේදී දෙල්ගහ කුඹුර යන නාමය සඳහන්ව ඇති බැවින් මෙය කුඹුරු ඉඩමක්ද නැද්ද යන්න තහවුරු කරගෙන තක්සේරුව ලබාගත් පසුව ඉදිරි කටයුතු කරන බව දන්වා ඇත. | පවතින ගිණුම්කරණ පරිචය තුල ගනුදෙනු හා සිද්ධීන්ගේ යථා ස්වරූපය මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පරිදි හා සම්පූර්ණ ලෙස ගනුදෙනු හා සිද්ධීන් ගිණුම්ගත කිරීමට කළමනාකරණය කටයුතු කලයුතු වීම. |
| (ආ) ඉකුත් වර්ෂ වලට අදාලව ගෙවා තිබුණු රු. 5,183,006 ක ප්‍රතිලාභ මුදල් ප්‍රතිලාභීන් මිය යාම නිසා නැවත අයකර ගැනීම පෙර වර්ෂවලට අදාල ගැලපීමක් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ වියදම් වලින් අඩුකර තිබීම හා ඉකුත් වර්ෂ වලට | 2021 වර්ෂයේ සිට නිවැරදිව ගිණුම් තැබීමට අදාල නිලධාරීන් දැනුවත් කරන බව දන්වමි. | පවතින ගිණුම්කරණ පරිචය තුල ගනුදෙනු හා සිද්ධීන්ගේ යථා ස්වරූපය මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පරිදි හා සම්පූර්ණ ලෙස ගනුදෙනු හා සිද්ධීන් ගිණුම්ගත කිරීමට කළමනාකරණය කටයුතු කලයුතු වීම. |

| | | |
|---|---|---|
| අදාලව ලැබී තිබුණ රු. 2,644,431 ක පොලී ආදායමක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස දක්වා තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු. 7,827,437 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | | |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

----------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සේවයෙන් ඉවත් වී තිබුණු නිලධාරිණියකගෙන් අධිකාරියට අයවිය යුතු රු.530,380 ක මුදල අයකර ගෙන නොතිබුණි. තවද, අධිකාරියේ නිලධාරීන් දෙදෙනෙකුට 2014 වර්ෂයේදී ලබාදී තිබුණු රු.1,830,450 ක අත්තිකාරම් මුදල් 2020 දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි. | රු.530,380 ක මුදල අයකර ගැනීමට නීතිපතිතුමා විසින් අදාල අයට එරෙහිව නඩු පැවරීම සඳහා වන පැමිණිලි කෙටුම්පත සකස්කොට ඇති බවත් නීතිපතිවරයා ලබා දෙන උපදෙස් මත ඉදිරි ක්‍රියා මාර්ග ගනු ලබන බව දන්වමි. | අධිකාරියට අයවිය යුතු මුදල් කඩිනමින් අදාල පාර්ශවයන් වෙතින් අයකර ගැනීමට කඩිනම් පියවර ගැනිමට කටයුතු කල යුතු වීම. |
| (ආ) රණවිරු මාපිය රැකවරණ දීමනා ක්‍රමය යටතේ 2016 ජූනි මාසයේ සිට 2017 නොවැම්බර් මස දක්වා මාස 18 ක කාලය තුල ගිණුම්හිමියන් දෙදෙනෙකු වෙත අවිධිමත් ලෙස රු.5,940,000 ක මුදලක් ගෙවා තිබුණි. මෙම මුදලින් රු.4,978,580 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකරගෙන නොතිබුණි. | අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇති අතර එම දෙපාර්තමේන්තුව විසින් කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක බී/11041/2018 යටතේ පැමිණිල්ලක් ගොනුකර අදාල විමර්ශන කටයුතු සිදුකරගෙන යන බවත් 2020.07.01 දින ආරක්ෂක අමාත්‍යාංශයේ පැවති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදි ආරක්ෂක ලේකම්තුමා දැනුවත් කරන ලද බවත් ඒ අනුව මෙම අක්‍රමිකතාවය පිලිබඳව පරික්ෂා කිරිමට කඩිනමින් කමිටුවක් පත්කරන ලෙස අතිරේක ලේකම්තුමිය (ආරක්ෂක) වෙත ආරක්ෂක ලේකම්තුමා දැන්වූ බව දන්වා ඇත. | අධිකාරියට අයවිය යුතු මුදල් කඩිනමින් අදාල පාර්ශවයන් වෙතින් අයකර ගැනීමට කඩිනම් පියවර ගැනිමට කටයුතු කල යුතු වීම. |

**2. මූල්‍ය සමාලෝචනය**

--------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

--------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 11,933,946 අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 14,424,207 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 2,490,261 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම

පිරිහීමට  සුපිරි වාසනා සම්පත ලොතරැයි ආදායම රු.15,171,240 කින් අඩුවීම සහ පොලී ආදායම රු.976,729 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| නිලධාරීන්ගේ වැටුපෙන් අඩුකර ගෙවියයුතු අග්‍රහාර රක්ෂණ වාරිකයේ  අර්ධයක වැය බර අධිකාරිය මගින් දරා තිබුණ අතර ප්‍රවර්තන වර්ෂය තුලදී ඒ සඳහා රු. 412,500 ක මුදලක් වැයකර තිබුණි. එවැනි සුභසාධන යෝජනා ක්‍රම ආරම්භ කිරීමට පෙර යහපාලනය පිළිබද මාර්ගෝපදේශ සංග්‍රහයේ 9.12 වගන්තිය ප්‍රකාරව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතියක් ලබාගෙන නොතිබුණි | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් මේ සඳහා අනුමැතිය ලබාගෙන නොමැති බව දන්වන අතර ඉදිරියේදී මේ සඳහා අදාළ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව දන්වමි | සුභසාධන යෝජනා ක්‍රම ආරම්භ කිරීමට පෙර අවශ්‍ය වන සියළු අනුමැතීන් ලබාගැනීමට කලමනාකාරිත්වය කටයුතු කලයුතු වීම. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) අධිකාරිය විසින් රණවිරුවන් වෙත තාවකාලික බලපත්‍ර මගින් 2002 වර්ෂයේදී ලබාදී තිබුණු බලංගොඩ හා කෑගල්ල පිහිටි ඉඩම් කොටස් 12 කට අදාලව ඔප්පු සැකසීමට අවශ්‍ය ලියකියවිලි යුද්ධ හමුදා නීති අධ්‍යක්ෂක මණ්ඩලය වෙත යොමුකර තිබුණද සමාලෝචිත  වර්ෂය අවසන් වන විටත් එම කටයුතු අවසන් වී ප්‍රතිලාභීන් වෙත නීත්‍යානුකූල අයිතිය ලබාදීමට කටයුතු කර නොතිබුණි. | බලංගොඩ හා කෑගල්ල ඉඩම් වලට අදාළ ඔප්පු සැකසිමට අවශ්‍ය  ලියකියවිලි යුද්ධ හමුදා නීති සේවා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත 2020.12.08 දින යොමුකර ඇති බවටත් මාලඹේ එක් ඉසම් කොටසක ඔප්පුවක් සඳහා 2020.12.24 වන දින සභාපතිතුමා විසින් අත්සන්කර ඇති බවත් දන්වා ඇත. | අධිකාරිය පිහිටුවීමෙන් බලාපොරොත්තුවන අරමුණු ඉෂ්ඨවන පරිදි අධිකාරිය මෙහෙයුම් කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව ඉටුකලයුතු බැවින් ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය ප්‍රතිලීභීන්ට කඩිනමින් ලබාදිය යුතු වීම. |

### 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රණවිරුවන් හා ඔවුන්ගේ පවුල්වල අභිවෘද්ධිය සඳහා අකුරුස්ස ප්‍රදේශයේ නිවසක් සහිත අක්කර 01 යි රූඩ් 03 යි පර්චස් 22 ක ඉඩම පරිත්‍යාග ලෙස අධිකාරියට 2009 වර්ෂයේදී ලැබී තිබුණද රු.මිලියන 21.14 ක් වටිනා මෙම දේපල 2019 වර්ෂයේ දෙසැම්බර් 19 දින සිට සමාලෝචිත වර්ෂය අවසන් වන තෙක් වසරකට අධික කාලයන් නිෂ්ප්‍රයෝජනව පැවතුණි. | මෙම වැඩිහිටි නිවාසය ආරම්භයේදී වැඩිහිටියන් තිදෙනෙකු නේවාසික පහසුකම් ලබාගන්නා ලද අතර 2019 ඔක්තෝබර් මාසය අවසන් වන විට ඔවුන් සියලු දෙනාම වැඩිහිටි නිවසින් ඉවත්ව ගොස් ඇති බවත් ආරක්ෂක ලේකම්තුමාගේ උපදෙස් පරිදි මෙම ඉඩම සහ අනෙකුත් දේපල (තාවකාලිකව) යුධ හමුදා සේවා මුක්ත භට සංගමයේ වැඩිහිටි නිවාසයක් ලෙස පවත්වාගෙන යාම සඳහා 2020.12.15 දින සිට ගිවිසුමක් අත්සන් කර ඇති බව දන්වා ඇත. | අධිකාරිය වෙත පරිත්‍යාග ලෙස ලැබෙන දේපල පිරිවිත හා උපකරණ අධිකාරියේ අරමුණු ඉෂ්ඨ වන ආකාරයට කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කල යුතුය. |

### 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සහකාර අධ්‍යක්ෂ පරිපාලන සහ සහකාර අධ්‍යක්ෂ ව්‍යාපෘති තනතුරු දෙක 2018 වර්ෂයේ සිට පුරප්පාඩුව පවතින අතර අදාල බඳවා ගැනීම් කිරීමට පියවර ගෙන නොමැති අතර වැඩසටහන් නිලධාරීන් 4 ක් සහ කළමනාකරණ සහකාර තනතුරු 7 ක් 2020 දෙසැම්බර් 31 දින වන විට පුරප්පාඩු වී ඇති බව නිරීක්ෂණය විය. | වර්තමාන පරිපාලනය විසින් සහකාර අධ්‍යක්ෂ (ව්‍යාපෘති) 01 ක්, වැඩසටහන් නිලධාරී 04 ක් සහ කලමනාකරණ සහකාර 07 ක් සඳහා 2021 වර්ෂයේ බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවන ලදී. | සමාලෝචිත වර්ෂය අවසානයට පවතින පුරප්පාඩු කඩිනමින් පිරවීමට අවශ්‍ය කලයුතු වීම. |